වාර්ෂික වාර්තාව
Annual Report
2011

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

Sri Lanka Inventors Commission
Ministry of Technology & Research

ලන්ලිබ් ගොඩනැගිල්ල, අංක 46/56, නවම් මාවත, කොළඹ 02.
LANLIB Building, No.46/56, Nawam Mawatha, Colombo 02

කොමිසමෙහි සාමාජිකයින්

දීපාල් සූරියආරච්චි මයා
කොමසාරිස්

ආචාර්ය එම්.ඒ. විජේරත්න
සහකාර කොමසාරිස්

ආචාර්ය ගමික ප්‍රතාපසිංහ
සහකාර කොමසාරිස්

පී.එම්. සුදර්ශනී පීරිස් මිය
භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)

ඩී. අනුරාධා එල්. ඉලේපෙරුම මිය
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී) (වැඩබලන)

කොමසාරිස්වරයාගේ සමාලෝචනය

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලාංකික නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ ශ්‍රී ලාංකික නවනිපැයුම්කරුවන් සඳහා නෛතික, මූල්‍යමය සහ තාක්ෂණික සහායය ලබාදීම හරහා ඔවුන්ගේ නිර්මාණශීලීත්වය දිරිගැන්වීමේ අරමුණ ඇතිව ස්ථාපනය කරනු ලැබූ ආයතනයකි. 2004 වසර දක්වා වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ මෙම කොමිසම 2010 වසර තෙක් ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විණි. 2010 මැයි මසදී ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතට ගැණිනි.

2011, අගෝස්තු මස 1 දින ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි කොමසාරිස්වරයා ලෙස මා වැඩ භාරගත් අවස්ථාවේ කොමිසමෙහි ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පැවතිණි. වැඩබලන අධ්‍යක්ෂවරයෙකු, වැඩබලන ගණකාධිකාරීවරයෙකු සහ වැඩබලන පරිපාලන නිලධාරීවරයෙකු විසින් එම තනතුරු හා අදාල නිල රාජකාරී කටයුතු ඉටු කරනු ලැබූ අතර මෙම නිලධාරීන් සියළුදෙනා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නිලධාරීන් වූහ. කාර්යාලය පැවතියේද ඉඩකඩ මඳ ප්‍රමාණවත් පහසුකම් නොමැති ස්ථානයකය.

කොමිසම විසින් ගනු ලබන උත්සාහයන්ගේ අවසන් ඵලය වන්නේ බිහිකෙරෙන වාණිජකරණය කළ හැකි නව දේශීය පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවයි. ගෝලීය වශයෙන් සාර්ථක වනුයේ පේටන්ට් බලපත්‍ර 10%ක ප්‍රමාණයකි. මෙබැවින් වාණිජකරණය කළ හැකි නවනිපැයුම් සංඛ්‍යාව ඉහළ නැංවීම මේ සඳහා ගත හැකි උපාය මාර්ගයයි. එසේ කිරීමට නම් නවනිපැයුම් තිරසාර අයුරින් ඉදිරියට රැගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන එම නවනිපැයුම් භාවිතයට ගන්නන්ගේ සංඛ්‍යාව වර්ධනය කළ යුතුය.

ආර්ථික තත්ත්වයන්, විද්‍යාත්මක සහ තාක්ෂණික අධ්‍යාපන මට්ටම් සහ නව අදහස් පිළිබඳ පවතින ආකල්ප යනාදිය නවනිපැයුම් සහ නවෝත්පාදන බිහිකිරීම සඳහා බලපාන තීරණාත්මක සාධක තුනකි.

නව නිපැයුම් බිහිකිරීමේ ක්‍රියාවලිය සලකා බැලීමේදී එය අදියර 03කට බෙදා දැක්විය හැකිය.

- **නිරීක්ෂණය** - නවනිපැයුම්කරුවන් ප්‍රබල නිරීක්ෂණ හැකියාවන් සහිත පුද්ගලයෝ වෙති. ඔවුන් යම් තත්ත්වයක් දෙස බලනුයේ නව දෘෂ්ඨි කෝණයකිනි. ඔවුහු එහි ඇති ගැටළුව නිර්වචනය කර එම ගැටළුව සඳහා පිළිතුරක් යාගනී. (ගැටළුව හෝ අවස්ථාව නිර්වචනය)
- **තාක්ෂණික මැදිහත් වීම** - ගැටළුව පැහැදිලි කරගැනීමෙන් අනතුරුව නවනිපැයුම්කරු ඔහු සතු තාක්ෂණික හැකියාවන් යොදාගනිමින් ඒ සඳහා විසඳුමක් සොයා ගැනීමට ක්‍රියා කරයි. මෙය මූලාදර්ශයක් වැඩිදියුණු කිරීම කරා ඔහුව රැගෙන යයි.

- **ප්‍රවර්ධනය** - මෙම පියවරේදී සිදුවන්නේ විසඳුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීම සහ නවනිපැයුම් වාණිජකරණයයි.

මෙය සැලකිල්ලට ගැනීමෙන් පසු කොමිසමෙහි සංයුක්ත සැලසුම මෙම අදියර තුන හා අනුකූල වන අයුරින් සකස් කෙරිණි. නවනිපැයුම් සාර්ථකව බිහිකෙරෙන ඒ සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා තෝරාගන්නා ලද නවනිපැයුම්කරුවන් කීපදෙනෙකු සඳහා සහාය ලබාදීමට කොමිසමෙහි අවධානය දැන් යොමු වී ඇත.

අගෝස්තු මස සිට මාස 05ක් වන් කෙටිකාල සීමාවක් තුළ 2008, 2009 සහ 2010 යන වර්ෂයන් සඳහා ජනාධිපති සම්මාන ප්‍රධානය කිරීමේ කාර්යය අවසන් කිරීමට කොමිසමට හැකිවිණි. කොමිසම විසින් ඇතුල්වීමේ ගාස්තුවක් අයකරමින් ප්‍රථම වරට නවනිපැයුම්කරුවන්ගේ සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබූ අතර නවනිපැයුම්කරුවන් සඳහා කළමනාකරණ දැනුම සපයාදීම සඳහා ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගීතාවයන් ගොඩනගා ගන්නා ලදි. තවද, පාසැල් නවනිපැයුම්කරුවන්ගේ සමාජ වැඩසටහන සඳහා නව පණක් ලබාදුන් අතර ශක්තිමත් පාලන රාමුවක්ද හඳුන්වාදෙනු ලැබිණි. පෞද්ගලික අංශයේ සහාය ඇතිව කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සිදුකරන ලද අතර නවනිපැයුම්කරුවන් සඳහා දැනුම් මධ්‍යස්ථානයක් ලෙස මෙන්ම ඔවුන් ව්‍යාපාරික ක්ෂේත්‍රය වෙත හඳුන්වාදීමේ යාන්ත්‍රණයක් ලෙසද ක්‍රියාකරන අංග සම්පූර්ණ වෙබ් අඩවි ක්‍රමෝපායයක්ද දියත් කරනු ලැබිණි. AVIVA NDB රක්ෂණ සමාගමෙහි අනුග්‍රාහකත්වය යටතේ විශේෂ කාර්ය මණ්ඩල පුහුණුකිරීම් සිදුකරන ලදි.

අවශ්‍ය කෙරෙන මිනිස් බල සහ මූල්‍ය සම්පත් සපයාදෙන්නේ නම් සිය නියෝගලත් කාර්යභාරය සාර්ථකව ඉටුකරමින් එහි අවසන් ප්‍රතිඵලය ලෙස දේශීය පේටන්ට් බලපත්‍ර ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමට කොමිසම දැන් සූදානමින් සිටී.

මෙහිදී මා වෙත මෙම අවස්ථාව ලබාදෙමින් ඇවැසි මාර්ගෝපදේශ ලබාදීම පිළිබඳව සහ අන් සියල්ලටම වඩා දේශපාලන අත්පෙවීම් වලින් සම්පූර්ණයෙන් නිදහස් වූ වැඩකරන පරිසරයක් මා වෙත ලබාදීම පිළිබඳව තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණියට සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාෆා මැතිතුමාටත් මාගේ කෘතඥතාවය පුද කරනු කැමැත්තෙමි.

මා වෙත ලබාදුන් වෘත්තීමය මාර්ගෝපදේශකත්වය සහ සහායය වෙනුවෙන් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් ධාරා විජයතිලක මහත්මිය වෙත මාගේ ස්තුතිය හිමි වේ.

තවද , මාගේ සහකාර කොමසාරිස්වරු දෙදෙනාටද. භාණ්ඩාගාර නියෝජිතවරියට සහ වැඩබලන තනතුරක සිට ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකල අධ්‍යක්ෂවරියටද මාගේ ස්තුතිය පුදකරමි.

සෑම විටම සිය නිල රාජකාරී කටයුතු වලින් ඔබ්බට ගිය සේවාවක් සපයමින් සිය දායකත්වය උපරිම ලෙස ලබාදුන් අමාත්‍යාංශයේ සහ කොමිසමෙහි අනෙකුත් සාමාජිකයින්ද මෙහිදී කෘතඥපූර්වකව සිහිපත් කරමි.

දීපාල් සූරියආරච්චි

කොමසාරිස්

පටුන

පිටු අංකය

1. හැඳින්වීම

1.1 ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම පිළිබඳ හැඳින්වීම 06

1.2 දර්ශනය 06

1.3 මෙහෙවර ප්‍රකාශනය 06

1.4 ප්‍රධාන ක්‍රමෝපායයන් 06

1.5 සංවිධානාත්මක ව්‍යුහය / මානව සම්පත් 7-8

2. කාර්යසාධනය

2.1 ජනාධිපති සම්මාන 09-18

2.1 ජාතික සම්මන්ත්‍රණය 19-20

2.3 කළමනාකරණ සභාය 21

2.4 මූල්‍යමය සභාය 21

2.5 වෙබ් අඩවිය 21-22

2.6 පාසැල් වැඩසටහන 23-24

2.7 පාලන රාමුව වැඩිදියුණු කිරීම 24

3. මූල්‍ය ප්‍රකාශන

3.1 ශේෂ පත්‍රය 25-26

3.2 ආදායම් හා වියදම් ගිණුම 27-28

3.3 සටහන් 29-33

3.4 මූල්‍යමය ව්‍යුහය 34

3.5 ගිණුම් ප්‍රතිපත්තීන් 35

4. විගණකාධිපති වාර්තාව 36-44

5. විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු 45-48

1. හැඳින්වීම

1.1 ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම යනු 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ තාක්ෂණික, මූල්‍යමය සහ නෛතික සහායය ලබාදීම හරහා දේශයේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමයි. කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් කොමිසම සමන්විත වේ. ජ්‍යේෂ්ඨ අමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින්, වසර 03ක කාල සීමාවක් සඳහා කොමිසමෙහි සාමාජිකයින් පත්කරනු ලැබේ.

1.2 දර්ශනය

"නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්"

1.3 මෙහෙවර ප්‍රකාශනය

- දේශයේ නවෝත්පාදන හැකියාවන් එළිදැක්වීමේ කාර්යයෙහිදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම.
- නව්‍ය අදහස් ප්‍රායෝගික භාවිතයන් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයමින් ඒ සඳහා පුරෝගාමීත්වය දැක්වීම.

1.4 ප්‍රධාන ක්‍රමෝපායයන්

1. ජාතික සංවර්ධන අභිමතාර්ථයන්ට අනුකූලත්වය දක්වන පරිදි ජනාධිපති සම්මාන ප්‍රදානය සිදුකිරීමට පියවර ගැනීම.
2. නවෝත්පාදන සංස්කෘතියෙහි පුළුල් ව්‍යාප්තිය අරමුණු කරගනිමින් "සහසක් නිමවුම්" ප්‍රදර්ශනය සහ නව නිපැයුම් මාසය පැවැත්වීම.
3. විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රතිලාභ ලබාදෙමින් පාසැල් මට්ටමේ වැඩසටහන් සඳහා නව පණක් ලබාදීම.
4. නවනිපැයුම්කරුවන් හට මූල්‍ය පහසුකම් සහ පෞද්ගලික අංශ්‍ය වෙත ප්‍රවිෂ්ඨ වීම සඳහා පහසුකම් සපයා දීම.
5. දැනුම සපයාදීම සහ විශේෂඥයින් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව ලබාදීම හරහා නවනිපැයුම්කරුවන් සවිබල ගැන්වීම.
6. ප්‍රධාන ආධාරකයක් ලෙස වෙබ් අඩවි ක්‍රමෝපාය හඳුන්වා දීම.
7. අපගේ නවනිපැයුම්කරුවන් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබාදීම
8. වත්මන් අවශ්‍යතාවයන් පිළිබිඹු කෙරෙන පරිදි පනත යාවත්කාලීන කිරීම.
9. කාර්ය මණ්ඩලයෙහි හැකියාවන් වැඩිදියුණු කිරීම.
10. ශක්තිමත් පාලන රාමුවක් හඳුන්වාදීම.

1.5 සංවිධානාත්මක ව්‍යුහය / මානව සම්පත්



මානව සම්පත් (2012.10.31 දින වන විට)

තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍ර:වි:නි:)	01	01 (වැඩබලන)	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	01		
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)	01	01 (වැඩබලන)	01
පරිපාලන නිලධාරී	01	01 (වැඩබලන)	01
ගිණුම් /මූල්‍ය නිලධාරී	01	-	01
වැඩසටහන් නිලධාරී	03	01	02
පර්යේෂණ සහකාර	05	03	02
කළමනාකරණ සහකාර	06	05	01
රියදුරු	03	02	01
කා.කා.ස.	02	02	-

කාර්ය සාධනය

2. කාර්ය සාධනය

2.1. ජනාධිපති සම්මාන

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි පනතෙහි 2 වගන්තියෙහි (ඊ) ඡේදයෙහි දක්වා ඇති නියෝගලත් කාර්යයක් වනුයේ පේටන්ට් බලපත්‍රලාභී ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීම හරහා සිය නව නිපැයුම් ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් දිරිගැන්වීමයි.

2008 වසර සඳහා ජයග්‍රාහකයින් තෝරාගෙන තිබූ නමුදු 2011 වසර වනතෙක් ඔවුන් හට සම්මාන ප්‍රදානය කර නොතිබිණි. 2009 සහ 2010 වර්ෂයන් සඳහා ජයග්‍රාහකයින් 2011 අගෝස්තු මසදී තෝරාගන්නා ලදි.

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතෙහි සඳහන් කර ඇති පරිදි ජනාධිපති සම්මාන සඳහා ජයග්‍රාහකයින් තෝරාගැනීම සිදුකරනු ලබන්නේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරනු ලැබූ, විනිසුරු මඩුල්ලක් මගිනි. පනතෙහි නියම කර ඇති ක්ෂේත්‍ර 09 යටතේ ඉදිරිපත් කරනු ලැබූ නවනිපැයුම් තෝරා ගැනීම සඳහා මේ වන තෙක් මෙම විනිසුරු මණ්ඩලය විශේෂඥයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. පුළුල් පරාසයක විහිදුනු තාක්ෂණික ක්ෂේත්‍රයන් ගණනාවක නවනිපැයුම් තෝරාගැනිමේ ක්‍රියාවලියේදී සාධාරණ විනිශ්චයක් ලබාදීමේ අරමුණින්, අයදුම්පත් ඉදිරිපත් වන ක්ෂේත්‍රයන් හා අදාලව විනිසුරු මඩුල්ලෙහි සාමාජිකයින් සංඛ්‍යාව පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් පියවර ගනු ලැබිණි. මෙහි අවශ්‍යතාවය පිළිබඳව ජනාධිපති මහ ලේකම් කාර්යාලය වෙත ඒත්තු ගැන්වීමට ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකිවූ අතර ඒ අනුව විවිධ ක්ෂේත්‍රයන් හා අදාළ වන පරිදි විශේෂඥ මඩුල්ලෙහි සාමාජිකයින් සංඛ්‍යාව 14ක් දක්වා ඉහළ නංවන ලදි. ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් අපේක්ෂා කරනු ලබන ජනාධිපති සම්මානයන්හි උසස් තත්ත්වය පිළිබඳව මෙම විනිසුරු මඩුල්ල වෙත කරුණු පැහැදිලි කරනු ලැබූ අතර වඩා හොඳ ප්‍රතිඵලයක් ලඟාකර ගැනීම සඳහා කොමිසමේ මාර්ගෝපදේශකත්වයද ලබා දෙනු ලැබිණි.
ගරු අමාත්‍යතුමියගේ නියෝගය මත වසරේ හොඳම නවනිපැයුම්කරු සඳහා පිරිනැමෙන ත්‍යාග මුදල සහ එක් එක් තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ජයග්‍රාහකයින් සඳහා පිරිනැමෙන ත්‍යාග මුදල් ඉහළ නැංවීම සිදුකෙරිණි. ඒ අනුව වසරේ හොඳම නවනිපැයුම්කරු සඳහා පිරිනැමෙන මුදල රුපියල් මිලියනයක් දක්වාද, එක් එක් ක්ෂේත්‍රයන්හි ජයග්‍රාහකයින් සඳහා පිරිනැමෙන ත්‍යාග මුදල් රුපියල් ලක්ෂයක් දක්වාද ඉහළ නංවන ලදි.

මෙම සම්මාන ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමිය සහ නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වනු ලැබිණි. 2008, 2009 සහ 2010 වර්ෂයන්හි ජයග්‍රාහකයින් සඳහා මෙහිදී සම්මාන ප්‍රදානය කෙරිනි. විනිශ්චය මණ්ඩලයෙහි තීරණයට අනුව, 2008, 2009 යන වර්ෂයන්හි අපේක්ෂිත මට්ටම දක්වා පැමිණි නවනිපැයුම් කිසිවක් නොවූ බැවින් එම වර්ෂයන්හි හොඳම නවනිපැයුම් සඳහා වන සම්මාන ප්‍රදානය නොකෙරිණි.

2010 වසරේ හොඳම නවනිපැයුම සඳහා වූ සම්මානය **වෛද්‍ය එස්.ජේ.බී. ලෙනදොර** විසින් වෛද්‍ය ක්ෂේත්‍රය හා අදාලව ඔහු විසින් නිර්මාණය කරනු ලැබූ සම්පීඩිත වාතය මඟින් ක්‍රියාකරන, ශල්‍ය කර්ම වලදී අනවශ්‍ය පටක ඈත් කර තබන උපකරණය (**Pneumatic self retaining surgical retractor system)** සඳහා හිමිකර ගනු ලැබිණි.

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2010 වසරේ හොඳම නව නිපැයුම සඳහා වූ සම්මානය ප්‍රදානය කරමින්

ගරු පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යතුමිය විසින් ජයග්‍රාහකයෙකු වෙත සම්මාන ප්‍රදානය කරමින්

සම්පීඩිත වාතය මඟින් ක්‍රියාකරන, ශල්‍ය කර්ම වලදී අනවශ්‍යය පටක ඈත් කර තබන උපකරණය

එක් එක් ක්ෂේත්‍රයන්හි සම්මානලාභීන්ගේ ලැයිස්තුව - 2010 වසර

---

1. ක්ෂේත්‍රය — කෘෂිකර්මාන්තය
   නවනිපැයුම — සකස් කල තේ කැබලිකරණය
   නවනිපැයුම්කරු — ඉංජිනේරු. රංජිත් රාජපක්ෂ. සී/ස ජිනසේන (පෞද්) සමාගම

---

2. ක්ෂේත්‍රය — ප්‍රවාහන
   නවනිපැයුම — ආරක්ෂිත යතුරුපැදි රඳවනය
   නවනිපැයුම්කරු — ආර්.ඒ.ඩී. මධුරංග කරුණාජීව

---

3. ක්ෂේත්‍රය — කර්මාන්ත හා තාක්ෂණය
   නවනිපැයුම — රබර් කිරි කැපීම සඳහා තාක්ෂණිකව වැඩිදියුණු කරන ලද “කිරි පිහිය”
   නවනිපැයුම්කරු — රුවන්පුර කරුණාසේන

---

4. ක්ෂේත්‍රය — වෛද්‍ය
   නවනිපැයුම — සම්පීඩිත වාතය මගින් ක්‍රියාකරන, ශල්‍ය කර්ම වලදී අනවශ්‍ය පටක ඈත් කර තබන උපකරණය
   නවනිපැයුම්කරු — වෛද්‍ය එස්.ජේ.බී. ලෙනදොර

ක්ෂේත්‍රය — ජාතික ආරක්ෂාව
නවනිපැයුම — ජීවිතාරක්ෂක හා ගලවාගැනීමේ ජැකට්ටුව
නවනිපැයුම්කරු — ජී.ඒ. නිරෝෂ් ක්‍රිෂාන්ත

---

5. ක්ෂේත්‍රය — පරිසරය

නවනිපැයුම — ස්වාභාවික රබර් ආශ්‍රිත බහාලුම් භාණ්ඩවලින් නිමවූ "පවර්මැට්"

නවනිපැයුම්කරු (කරුවන්) — මහාචාර්ය අසෝක නුගවෙල.
ඩිල්හාරා එදිරිසිංහ
මානෙල් කාන්ති මහානාම

කුසලතා සම්මාන හිමිකරගත් ජයග්‍රාහකයන් - 2010 වසර

1. ක්ෂේත්‍රය — කෘෂිකර්මාන්තය

නවනිපැයුම — ඕලු ඇට භාවිතයෙන් සකස්කරනු ලැබූ ආහාර

නවනිපැයුම්කරු — ඩී.එම්.ඒ.සී.පී. දසනායක

---

2. ක්ෂේත්‍රය — කෘෂිකර්මාන්තය

නවනිපැයුම — ස්වයංක්‍රීය ගම්මිරිස් ඇට වෙන්කරණය

නවනිපැයුම්කරු — කේ.පී. චමිල චින්තන කරුණාසිංහ

---

3. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය

නවනිපැයුම — මදුරු දැලක් තුළ වාතය සංසරණය කිරීමේ උපකරණය

නවනිපැයුම්කරු — කේ. නාලක චන්ද්‍රවංශ

---

4. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය
නවනිපැයුම — සංයුක්ත ජීවවායු නිපදවන උපකරණය
නවනිපැයුම්කරු — ජේ.එච්. ශ්‍රීමාල් තිසේරා

---

5. ක්ෂේත්‍රය — පරිසරය
නවනිපැයුම — රබර් කිරි කැපීම සඳහා ගෝලාකාර පාරිසරික සැකසුම් තාක්ෂණය
නවනිපැයුම්කරු — ටී.එස්.එස්. ගෝමස්

---

6. ක්ෂේත්‍රය — කර්මාන්ත හා තාක්ෂණය
නවනිපැයුම — නව කාර්මික අත්වැසුම්
නවනිපැයුම්කරු — සී/ස ATG ග්ලවුස් (පෞද්) සමාගම

---

7. ක්ෂේත්‍රය — ප්‍රවාහන
නවනිපැයුම — නව විද්‍යුත් රථ ඔසවනය
නවනිපැයුම්කරු — වයි.ඒ. ලයනල් රූපරත්න

එක් එක් ක්ෂේත්‍රයන්හි සම්මානලාභීන්ගේ ලැයිස්තුව - 2009 වසර

---

1. ක්ෂේත්‍රය — කර්මාන්ත හා තාක්ෂණය

   නවනිපැයුම — අධි කාර්යක්ෂම ඒකීය තේ ප්‍රවාහන කන්ටේනරය

   නවනිපැයුම්කරු — නොයෙල් ඒ. තෝමස්

---

2. ක්ෂේත්‍රය — භෞතික විද්‍යාව

   නවනිපැයුම — රේඩියස් මීටරය

   නවනිපැයුම්කරු — දිනේෂ් සඳරුවන් කටුගම්පොළ

කුසලතා සම්මාන හිමිකරගත් ජයග්‍රාහකයින් - 2009 වසර

1. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය

   නවනිපැයුම — සිංහල සහ දමිළ භාෂාවන් සඳහා පරිගණක අක්ෂර යෙදවුම

   නවනිපැයුම්කරු — එස්.ඩී.ඊ්. ගුණතිලක

---

2. ක්ෂේත්‍රය — පරිසරය

   නවනිපැයුම — ආම්ලික අපජල (ස්කාගාර අපජල) පිරිපහදුව සඳහා නිර්වායුක පෙරණ තාක්ෂණය

   නවනිපැයුම්කරු — අතුල ජයමාන්න

---

3. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය
නවනිපැයුම — ස්වභාවික ගුරුත්ව ජල පෙරණය
නවනිපැයුම්කරු — එච්.එම්. නවරත්න

4. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය
නවනිපැයුම — විශ්වාසනීය චෙක්පත්ප්‍රොටොකෝලය
නවනිපැයුම්කරු — ක්‍රිස්ටීන් සේෂිකා ආන්ජනී ප්‍රනාන්දු

එක් එක් ක්ෂේත්‍රයන්හි සම්මානලාභීන්ගේ ලැයිස්තුව - 2008 වසර

1. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය
නවනිපැයුම — එන්නත් ගබඩාකර තැබීමේ ශීතකරණයක්
නවනිපැයුම්කරු — එම්.ඒ. ප්‍රින්ස් චන්ද්‍රසේන

2. ක්ෂේත්‍රය — කර්මාන්ත හා තාක්ෂණය
නවනිපැයුම — කාන්තා උඩුකය ආවරණ සඳහා වයර් ඇතුළත් කිරීමේ යන්ත්‍රය
නවනිපැයුම්කරු — ගරුසිංහගේ ජානක බණ්ඩාර ගරුසිංහ

3. ක්ෂේත්‍රය — ඉංජිනේරු විද්‍යාව

නවනිපැයුම — කජු ලෙලි උඳුන සහ විජලන ඒකකය

නවනිපැයුම්කරු — බී.කේ. මහීපාල



කුසලතා සම්මාන හිමිකරගත් ජයග්‍රාහකයින් - 2008 වසර

1. ක්ෂේත්‍රය — වෛද්‍ය

නවනිපැයුම — ඇදුම / ශ්වසන රෝග සඳහා යෝග්‍ය ඒක මාත්‍රිකා ඉන්හේලරය

නවනිපැයුම්කරු — වෛද්‍ය අනිල් ගුණතිලක

---

2. ක්ෂේත්‍රය — ඉංජිනේරු විද්‍යාව

නවනිපැයුම — පොල් සිහින්ව කුඩුකර (පවුඩර්) ගෘහස්ථව සකසා ගත හැකි යන්ත්‍රය

නවනිපැයුම්කරු — වැලිසරගේ ජයවීර

---

3. ක්ෂේත්‍රය — කර්මාන්ත හා තාක්ෂණය

නවනිපැයුම — මැණික් ගල් හෝ වෙනත් සමාන දෙයක් ඉතා සියුම් ලෙස හැඩගැන්වීම සඳහා වූ නව උපකරණය

නවනිපැයුම්කරු — සී/ස සතිර ජෙම්ස් (පෞද්) සමාගම

---

4. ක්ෂේත්‍රය — මහජන සුභසාධනය

නවනිපැයුම — ජංගම දුරකථන මාර්ගයෙන් මුදල් හුවමාරු කිරීම.

නවනිපැයුම්කරු — හැරල්ඩ් විජේතුංග

ත්‍යාග මුදල්හි වටිනාකම

වසරේ හොඳම නවනිපැයුම්කරු සඳහා	- රුපියල් මිලියන 01
එක් එක් කෂේත්‍රයන්හි ජයග්‍රාහකයින් සඳහා	- රු. 100,000/= බැගින්
කුසලතා සම්මාන සඳහා	- රු. 25,000/= බැගින්

ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ ඉතිහාසයේ ප්‍රථම වරට තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමිය විසින් සෑම විනිශ්චයකරුවෙකු සඳහාම සමරු තිළිණයක් ප්‍රදානය කරමින් ඔවුන් ඇගයීමට ලක් කරන ලදි.

මාධ්‍ය සබඳතාවයන් උපායමාර්ගිකව කළමනාකරණය කර ගැනීම තුලින් මෙම අවස්ථාව සඳහා සහ සම්මානලාභී නවනිපැයුම්කරුවන් සඳහා සැලකිය යුතු අන්දමේ ප්‍රචාරණයක් නොමිලේ ලබාගැනීමට අපට හැකියාව උදාවිණි. මෙම සම්මාන ප්‍රදානෝත්සවය පිළිබඳ සහ නවනිපැයුම්කරුවන් පිළිබඳ ප්‍රතිරූපයක් ගොඩනැංවීම සඳහා ප්‍රමුඛ පෙළේ පුවත්පත් දැන්වීම් පළ කරනු ලැබූ අතර ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විශේෂ වැඩසටහනක්ද විකාශය කෙරිනි.

ජයග්‍රාහකයින් සඳහා පිරිනමන ලද මුදල් ත්‍යාගයන්ද ඇතුළුව 2008, 2009 සහ 2010 වර්ෂයන්හි ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය සඳහා වැය වූ මුළු වියදම රු. මිලියන 8.6 කි.

4.2 ජාතික සම්මන්ත්‍රණය

නවනිපැයුම්කරුවන් සඳහා ඉතිහාසයේ ප්‍රථම වරට පවත්වනු ලැබූ සම්මන්ත්‍රණය වනුයේ මෙයයි. තම නවනිපැයුම් අලෙවිකිරීමේදී සාර්ථක වීම සඳහා නවනිපැයුම්කරුවන් විසින් අත්‍යාවශ්‍යයෙන් දැන සිටිය යුතු කරුණු පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම සහ ඔවුන් විසින් මුහුණ දෙනු ලබන පොදු ගැටළු සමහරක් සඳහා විසඳුම් ලබාදීමත් අරමුණු කරගනිමින් මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදි.

මෙහි ප්‍රථම අදියරෙහිදී සිදු වූයේ දැනුම ලබාදීමයි. මෙම අදියර නවනිපැයුම්කරුවන් අභිප්‍රේරණය කෙරෙන අයුරින් සහ ඔවුන් හට දැනුම ලබාදීම සඳහා සැකසී තිබිණි. දිවයිනෙහි ප්‍රමුඛ පෙළේ වෘත්තිකයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් නවනිපැයුම්කරුවන් දැනුවත් කිරීම සඳහා විවිධ අංශයන් පිළිබඳ දේශන පවත්වන ලදි.

මෙහිදී අවධානය යොමු කරනු ලැබූ ක්ෂේත්‍රයන් වූයේ නවනිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපළ හිමිකම් ආරක්ෂා කිරීම, ව්‍යාපාර සැලසුම් කිරීම, අලෙවිකරණය සහ සාර්ථක ව්‍යවසායකයින් විසින් අනුගමනය කරනු ලැබූ සාර්ථක පිළිවෙත් බෙදාගැනීම යනාදියයි.

දෙවන අදියරෙහිදී සිදුවූයේ නවනිපැයුම්කරුවන් මුහුණදෙන පොදු ගැටළු සමහරක් සඳහා විසඳුම් ලබාදීමයි. මේ සඳහා බැංකු, කාර්මික තාක්ෂණ ආයතනය සහ නර්ඩ් යන ආයතනයන්හි නියෝජිතයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් පත් කරනු ලැබ තිබිණි. මෙහිදී ඉදිරිපත් වූ තර්කානුකූලව පිළිගත හැකි ඉල්ලීම් බොහෝමයක් සඳහා විසඳුම් ඉදිරි කාලසීමාව සඳහා වන සංයුක්ත සැලසුමෙහි ඇතුළත් කර ඇති බව අපගේ අදහසයි.

ප්‍රථම වරට සම්මන්ත්‍රණය සඳහා සහභාගීවීමේ ගාස්තුවක් අය කරනු ලැබිණි. ඉලක්ක කරන ලද ආයතනයන්හි ආරාධිතයින්ද ඇතුළත්ව 176 දෙනෙකුගේ සහභාගීත්වය මේ සඳහා ලැබිණි. මොවුන් අතුරින් අඩු ගාස්තුවක් ගෙවන ලද සිසුන් 15 දෙනෙකු ඇතුළත්ව 96 දෙනෙකු විසින් සහභාගී වීමේ ගාස්තුව ගෙවන ලදි. මෙම සම්මන්ත්‍රණය සඳහා දිවයිනෙහි විවිධ ප්‍රදේශයන්හි සිට පැමිණියවුන්ගේ සහභාගීත්වය ලැබිණි.

මෙම සම්මන්ත්‍රණය හා සමගාමීව නවනිපැයුම්කරුවන් වෙතින් තොරතුරු ලබාගනිමින් ඔවුන් පිළිබඳ අංගසම්පූර්ණ දත්ත ගබඩාවක් වැඩිදියුණු කරනු ලැබිණි. මේ සම්බන්ධයෙන් නවනිපැයුම්කරුවන් වෙතින් ලද ප්‍රතිචාර ඉතා සතුටුදායක හා දිරිගන්වන සුළු අන්දමේ විය. මෙම වැඩසටහන සඳහා වැයවූ මුළු වියදම රු. 504,933.70ක් වූ අතර සහභාගීවීමේ ගාස්තු ලෙස රු. 83,250.00ක් ලැබිණි.

ජාතික සම්මන්ත්‍රණයෙහි සම්භාවනීය ආරාධිතයින් සහ දේශකයින් සමහරක්

මහත් උද්යෝගයෙන් දේශනයන් සඳහා සවන්දෙන නවනිපැයුම්කරුවන්ගෙන් කොටසක්

2.3 කළමනාකරණ සහාය

නවනිපැයුම් වාණිජකරණය කිරීමේදී, තමන් විසින්ම සිය ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට නම් ව්‍යාපාර කළමනාකරණ හැකියාවන් නවනිපැයුම්කරුවන් සතුව තිබිය යුතු අතර සිය ව්‍යාපෘතීන් සඳහා මූල්‍යාධාර ලබාගැනීම සඳහා ආයෝජකයින් හෝ බැංකු වෙත ප්‍රවේශ විය යුතුය. මේ සඳහා ව්‍යාපාර කළමනාකරණ හැකියාවන් සහ දක්ෂතාවන් පිළිබඳව දැනුම ඔවුන් සතු විය යුතුය. අප විසින් කරනු ලැබූ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) සහ කැළණිය විශ්වවිද්‍යාලය විසින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ශිෂ්‍යයින්ගේ පශ්චාත් උපාධි වැඩසටහනෙහි අවශ්‍ය අංගයක් ලෙස ඔවුන් නවනිපැයුම්කරුවන් හා සම්බන්ධ කිරීම සඳහා එකඟත්වය පළකරන ලදි. මෙය නවනිපැයුම්කරුවන් වෙනුවෙන් ගනු ලැබූ සුවිශේෂී වැදගත්කමකින් යුතු පියවරකි.

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සමග අවබෝධතා ගිවිසුමකට එළැඹී අතර ඒ යටතේ වාර්ෂිකව නවනිපැයුම්කරුවන් 100 දෙනෙකු සඳහා නොමිලේ ආහාර සහ ද්‍රව්‍යද සපයාදෙමින් එක්දින "අලෙවිකරණය පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහනක්" සුප්‍රකට අලෙවිකරණ විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබීය.

2.4 මූල්‍යමය සහාය

ව්‍යාපෘතීන් වාණිජකරණයේදී අනුග්‍රාහකත්වය දැක්වීම හෝ හවුල්කරුවෙකු ලෙස කටයුතු කිරීම සඳහා පෞද්ගලික අංශය වෙත නවනිපැයුම්කරුවන් හඳුන්වාදීමේ සැලසුමක් සකස් කොට ඇත.

2.5 වෙබ් අඩවිය

නවනිපැයුම්කරුවන් ප්‍රවර්ධනය සහ ඔවුන් සඳහා සහායය ලබාදීමේදී ශක්තිමත් වේදිකාවක් ලෙස ක්‍රියාකිරීම සඳහා අංග සම්පූර්ණ වෙබ්අඩවියක් වැඩිදියුණු කිරීම පිණිස විකිණුම්කරුවෙකු කොමිසම විසින් පත්කරනු ලැබිණි. මෙම වෙබ් අඩවියෙහි ප්‍රධාන ලක්ෂණ සමහරක් පහත දක්වා ඇත.

- **"ගැණුම්කරු විකිණුම්කරු වෙළඳපොළ" -** මෙය නවනිපැයුම්කරුවන් ව්‍යාපාරික ලෝකය වෙත හඳුන්වාදීම සඳහා ගනු ලැබූ ප්‍රයත්නයකි. මෙහිදී සිය තාක්ෂණික ගැටළු සඳහා නවනිපැයුම්කරුවන් හරහා විසඳුම් ලබාගනු පිණිස එම ගැටළු වෙබ් අඩවියෙහි පළ කිරීමට සමාගම් හට ඇරයුම් කෙරෙනු ඇත. ව්‍යාපාරයන් සඳහා ආයෝජකයින් සොයාගැනීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයින් සඳහා උදාකර දෙන තෝතැන්නක් ලෙසද මෙය කටයුතු කරනු ඇත.

- නව අදහස් සහ සිසුන්ගේ නව සොයාගැනීම් එළිදක්වනු පිණිස පාසැල් නවනිපැයුම් සමාජ සඳහා වෙබ් පිටුවක් වෙන් වෙනු ඇත.

- නවනිපැයුම්කරුවන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමේ ප්‍රධාන පිවිසුම් මඟ ලෙස වෙබ් අඩවිය කටයුතු කරනු ඇති අතර නවනිපැයුම්කරුවන් සඳහා නවතම දැනුම සපයාදීමද සිදුකෙරෙනු ඇත.

- පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පහසුවෙන් අවබෝධ කර ගත හැකි වන පරිදි පියවරෙන් පියවර ගෙන හැර දැක්වීම.

- තුන්වෙනි පාර්ශවයන් සමඟ ගිවිසුම් වලට එළැඹීමේදී නවනිපැයුම්කරුවන් විසින් භාවිතයට ගැනීම සඳහා හෙළිනොකරන ගිවිසුම්හි සාම්පලයක්.

- මෙම වෙබ් අඩවිය තුල නවනිපැයුම්කරුවන් පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යනු ලැබෙනු ඇති අතර ඔවුන් සමඟ කෙටි පණිවුඩ ඇසුරින් සන්නිවේදනයන් කිරීමට මෙය ඉවහල් වනු ඇත. Face Book සහ Twitter වැනි සමාජයීය මාධ්‍යයන්ද සම්බන්ධ කෙරෙනු ඇත.

සංයුක්ත සැලසුම, ඉලක්කයන්ට එරෙහිව කාර්යසාධනය සහ සියළු ප්‍රධාන පෙළේ ප්‍රසම්පාදන කාර්යයන් මෙම වෙබ් අඩවියෙහි පළ කිරීම හරහා ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි විනිවිදභාවය සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහාද මෙම වෙබ් අඩවිය යොදාගැනෙනු ඇත. මෙම වෙබ් අඩවිය පවත්වාගෙන යාම සඳහා කොමිසමෙහි කාර්ය මණ්ඩලය ආයතනය තුළ පුහුණු කෙරෙනු ඇත.

වෙබ් අඩවිය දියුණු කිරීම සඳහා මුළු වියදම රු. 322,000.00ක් වන අතර පළමු වාරිකය ලෙස රු.80,500.00ක මුදලක් ගෙවීම් කරන ලදි. 2012 අප්‍රේල් මසදී මෙම වෙබ් අඩවිය වැඩිදියුණු කොට අවසන් කිරීමට නියමිතය.

2.6 පාසැල් වැඩසටහන

රටෙහි නවනිපැයුම් සංස්කෘතියක් නිර්මාණය කිරීමේ ලා සිදු කල යුතු ප්‍රධානතම ක්‍රියාකාරකමක් වනුයේ පාසැල් මට්ටමින් නවනිපැයුම් ප්‍රවර්ධනය කිරීමයි. අතීතයේදී ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝග අනුව ක්‍රියාකරමින් මෙය ආරම්භ කෙරිනි. ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කාර්යමණ්ඩලය විසින් නවනිපැයුම් සමාජ භෞතික වශයෙන් ප්‍රවර්ධනය කිරීමේදී පැනනගින සම්පත්හි සීමාසහිත බව සැලකිල්ලට ගනිමින් මේ සඳහා පහසුකම් සැපයීමේ වේදිකාවක් ලෙස මාධ්‍ය භාවිතා කිරීමට තීරණය කෙරිණි.

උතුරුමැද පළාතේ රඹෑව ම:ම:වි, වලිසිංහ හරිශ්චන්ද්‍ර ම:ම:වි, තඹුත්තේගම ම:ම:වි, බැස්ටියන් සිල්වා ම:වි සහ මිහින්තලේ ම:වි යන පාසැල්හි නිර්මාණශීලීත්වය සහ නවනිපැයුම් බිහිකිරීම පිළිබඳ උනන්දුවක් දක්වන සිසුන් සඳහා සම්මන්ත්‍රණ 5ක් පවත්වනු ලැබිණි. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසැල් 50කට වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරමින් සිසුහු සහභාගී වූහ.

බස්නාහිර පළාතේ නුගේගොඩ ශාන්ත ජෝෂප් විද්‍යාලයේ සහ ශ්‍රී සුමංගල බාලිකා මහා විද්‍යාලයේදී ශිෂ්‍ය සම්මන්ත්‍රණ 2ක් පවත්වන ලදි.

මෙහිදී අවධානය යොමු කරනු ලැබූ ක්ෂේත්‍රයන් වූයේ "පාසැල් නවනිපැයුම් සමාජ පිහිටුවාගන්නා අයුරු සහ ඒවා සක්‍රීයව පවත්වා ගෙන යන අයුරු", "නවනිපැයුම් බිහිකිරීම සඳහා සිසුන් දිරිගන්වන අයුරු සහ පාසැල් අන්තර් නිවාසයීය නවනිපැයුම් තරඟ සංවිධානය කරන අයුරු" සහ "බුද්ධිමය දේපළ හිමිකම් ආරක්ෂණය" යනාදියයි. මෙම වැඩසටහන සඳහා වැයූ මුළු මුදල රු. 141,043.00 කි.

2.6.1 පාසැල් ගුරුවරුන් සඳහා වූ වැඩසටහන

පාසැල්හි තරුණ නවනිපැයුම්කරුවන්ගේ සමාජ භාරව සිටින ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ 02ක් 2011 වර්ෂය සඳහා පවත්වනු ලැබිණි. මින් පළමුවැන්න බස්නාහිර. සබරගමුව, වයඹ සහ දකුණු පළාත්හි පාසැල් ගුරුවරුන් සඳහා නොවැම්බර් 18 දින කොළඹදී පවත්වන ලදි. තැපැල් අර්බුදයක් පැවතියද ගුරුවරු, කලාපීය සහ පළාත් මට්ටමේ සම්බන්ධීකරණ අධ්‍යක්ෂවරු සහ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඇතුළු 120 දෙනෙක් මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූහ. බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලයේ තරුණ නවනිපැයුම්කරුවන්ගේ සමාජය භාර ගුරු මහතා විසින් බෙදා ගනු ලැබූ හොඳ පිළිවෙත් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි (IESC) ඉංජිනේරු ජේ. මීගොඩ මහතා විසින් පැහැදිලි කරණු ලැබූ තරුණ නවනිපැයුම්කරුවන් හට සම්මාන ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය මඟින් මොවුහු අභිප්‍රේරණයක් ලැබූහ.

නවනිපැයුම් බිහිකිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සහ නවනිපැයුම් බිහිකිරීමේ ක්‍රියාවලිය සඳහා සහභාගී වීම තුළින් සිසුන්ගේ ජීවන කුසලතාවයන් ඔප් නැංවෙන ආකාරය පිළිබඳව ගුරුවරුන් වෙත පැහැදිලි කරදෙනු ලැබිණි. මෙමඟින් රටෙහි විද්‍යා අධ්‍යාපනයද ඉහළ නැංවෙනු ඇත. පාසැල තුළ නවනිපැයුම්කරුවන්ගේ සමාජ පිහිටුවා ගන්නා අයුරු පිළිබඳ මාර්ගෝපදේශනයන් සහ ලොව පුරා සිසුන්ගේ නවනිපැයුම්හි එකතුවක් සහිත ඩී.වී.ඩී. පටයක් සෑම ගුරුවරයෙකු සඳහාම ප්‍රදානය කෙරිනි. ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ගුරුවරුන් සඳහා මෙවන් මෙවලමක් ලබාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

මෙම සම්මන්ත්‍රණ මාලාවේ දෙවැන්න මහනුවර. ගන්නෝරුව රණබිම රාජකීය විද්‍යාලයේදී දෙසැම්බර් 05 දි පැවැත්විණි. මධ්‍යම පළාතේ ගුරුවරු 75 දෙනෙකුට වැඩි සංඛ්‍යාවකගේ සහභාගීත්වය මේ සඳහා ලැබිණි. මෙම වැඩසටහන සඳහා වැයවූ මුළු වියදම රු. 497,838.70 කි.

2.6.2 Learn TV යනු ඩයලොග් ටී.වී. හරහා විකාශය කෙරෙන අධ්‍යාපනික නාලිකාවකි. නවනිපැයුම් සමාජ පිළිබඳ සැකසුණු වැඩසටහන් මාලාවක් විකාශය කිරීම සඳහා ඔවුන් එකඟත්වය පළ කළ අතර පිටස්තර පාර්ශවයන් වෙතින් කුලී පදනම මත සේවය ලබාගැනීමෙන් තොරව මෙහි අවශ්‍ය කෙරෙන පටිගත කිරීම් කාර්යමණ්ඩල සාමාජිකයින් විසින් සිදුකෙරිණි. මෙම වැඩසටහන් මඟින් සිසුන්ගේ නවනිපැයුම් ප්‍රදර්ශනය කර පෙන්වන අතර මෙම නවනිපැයුම් සඳහා පාදක වූ විද්‍යාත්මක මූලධර්මය පැහැදිලි කිරීම සඳහා ඉගැන්වීමේ ආධාරකයක් ලෙසද මෙම වැඩසටහන් යොදා ගැනෙනු ඇත.

2.7 පාලන රාමුව වැඩිදියුණු කිරීම.

2.7.1 පාලක මණ්ඩල රැස්වීම් **-** මාසිකව පාලක මණ්ඩල රැස්වීම් විධිමත් පරිදි පැවැත්වෙනු ලබන අතර ආයතනයෙහි සියළු අංගයන් පිළිබඳ කරුණු මණ්ඩලයේ අවධානයට ලක් කෙරේ. සහකාර කොමසාරිස්වරු මෙම රැස්වීම් සඳහා ඵලදායී විවාදයන්හි යෙදෙමින් සහ ඔවුන්ගේ විශේෂඥ ඥානය බෙදාගනිමින් සක්‍රීය ලෙස සිය සහභාගීත්වය දක්වති.

මූලාශ්‍ර ප්‍රකාශය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

2011 දෙසැම්බර් 31 දිනට

ශේෂපත්‍රය

වත්කම්	සටහන්	2011 රු. ශත.	2010 රු. ශත.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	5	**1,872,993.27**	4,704,423.34
ජංගම වත්කම්			
අනෙකුත් කොන්ත්‍රාත්තුමය සේවාවන් සඳහා පූර්ව ගෙවීම		**341,088.44**	341,088.44
ආපදා ණය		**549,722.00**	791,882.00
ණය - නවනිපැයුම්කරුවන්ගේ අරමුදල		**9,781,804.80**	9,933,330.00
නැවත ගෙවනු ලබන තැන්පතුව			0.00
උත්සව අත්තිකාරම්		**14,800.00**	15,300.00
(ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය,			
ක්‍රමසම්පාදන සහක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය)		**7,560.00**	7,560.00
ඉන්ධන තැන්පතු		**100,000.00**	100,000.00
ඡන්ද කොමසාරිස්		**13,524.50**	19,729.50
අනෙකුත් අත්තිකාරම්	7	**136,632.80**	2,835,094.30
මුදල් හා බැංකු ශේෂ	8	**3,409,438.49**	3,430,531.18
මුළු වත්කම්		**16,227,564.30**	22,178,938.76
මුදල් සහ බැරකම්			
සමුච්චිත අරමුදල	9	**10,087,396.53**	14,310,620.91
අනෙකුත් අරමුදල්	10	**2,543,450.34**	2,523,450.34
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම.	11	**1,467,441.38**	1,455,287.50
ජංගම බැරකම්			
උපචිත වියදම්	12	**2,129,276.05**	3,889,580.09
මුළු මුදල් සහ බැරකම්		**16,227,564.30**	22,178,938.84

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ආදායම් වියදම් ගිණුම

ආදායම	සටහන්	2011 රු. ශත.	2010 රු. ශත.
රජයේ දායකත්වය			
රජයේ දායකත්වය – පුනරාවර්තන		**11,963,400.00**	12,651,000.00
රජයේ දායකත්වය – නවනිපැයුම්කරුවන්ගේ අරමුදල			0.00
එකතු කිරීම.			
අනෙකුත් ආදායම්			
අනෙකුත් ආදායම්	4	**158,675.18**	659,780.27
වාහන අලෙවිය			1,036,000.00
විදේශ විනිමය			
මුළු ආදායම		**12,122,075.18**	14,346,780.27
අඩු කිරීම			
වියදම්			
(1) පාලන හා ආයතන			
කාර්යමණ්ඩලය සඳහා ගෙවීම්	1	**5,298,145,.68**	5,692,551.45
පාලන හා ආයතන වියදම්	2	**8,137,683.86**	8,499,130.47
ක්ෂය වීම – ස්ථාවර වත්කම්	5	**3,023,690.15**	3,068,940.02
පාරිතෝෂික	11	**169,261.38**	195,182.50
(11) ව්‍යාපෘති වියදම්			
නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්	3	**3,169,056.49**	4,363,454.43
මුළු වියදම		**19,797,837.56**	21,819,258.87
වියදමට එරෙහිව ආදායම්		**(7,675,762.38)**	(7,472,478.60)
ආදායම සමුච්චිත ආදායම වෙත මාරු කිරීම		**12,122,075.18**	14,346,780.27

සකස් කළේ   :   ....

පරීක්ෂා කළේ :   ....

අත්සන් කළේ :

....	....
ඒ.කේ.පී. පීරිස්	**ඩී. අනුරාධා එල්. ඉලේපෙරුම**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	**අධ්‍යක්ෂ**
28.03.2012	28.03.2012

ගිණුම් සටහන්

		2011 (රු. ශත.)	2010 (රු. ශත.)
අංක 01 - කාර්යමණ්ඩලය සඳහා ගෙවීම්			
වැටුප්		**2,949,512.57**	3,369,214.70
ජීවන වියදම් දීමනා		**935,805.00**	922,112.50
විශේෂ දීමනාව		**135,903.95**	-
සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල		**518,083.14**	453,963.47
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල		**103,616.62**	90,792.68
කොමිසමේ සාමාජිකයින් සඳහා ගෙවීම්		**440,910.00**	598,850.00
අතිකාල සහ නිවාඩු දින සඳහා වැටුප් ගෙවීම්		**214,314.40**	230,618.10
		5,298,145.68	5,692,551.45
අංක 02 - පාලන සහ ආයතනික වියදම්			
ගමන් - දේශීය		**48,917.00**	59,838.25
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා		**144,884.10**	50,361.32
ඉන්ධන සහ ලිහිසි තෙල්		**261,381.00**	748,924.00
වාහන අළුත්වැඩියාව සහ නඩත්තුව		**510,432.19**	493,907.24
උපකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව		**152,867.29**	50,135.00
තැපැල් ගාස්තු		**8,520.00**	5,600.00
දුරකථන ගාස්තු		**210,905.87**	282,476.84
උපයෝගීතාවයන්		**152,768.00**	104,850.00
කොන්ත්‍රාත්තුමය සේවාවන්		**367,223.13**	616,519.59
විදුලි ගාස්තු		**474,849.83**	460,.056.00
පිරිසිදු කිරීමේ සේවාවන්		**162,000.00**	162,000.00
ජල ගාස්තු		**75,875.01**	60,940.11
කුළිය		**5,188,295.44**	5,029,269.10
සම්මාදම් සහ දායකත්වයන්		**-**	-
විනෝදාස්වාදාත්මක වියදම්		**68,849.10**	46,830.02
අනෙකුත් පරිපාලනමය වියදම්		**35,885.90**	29,723.00
පුවත්පත් සහ වාර සඟරා		**24,030.00**	47,700.00
බැංකු ගාස්තු		**-**	-
ශුභසාධන වියදම්		**-**	-
විගණන ගාස්තු		**250,000.00**	250,000.00
		8,137,683.86	8,499,130.47

ගිණුම් සටහන්

	2011 (රු. ශත.)	2010 (රු. ශත.)
අංක 03 - නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්		
ජනාධිපති සම්මාන උළෙල	**1,518,124.43**	25,960.00
නිර්මාණශීලී සමිතීන් සංවිධානය	**-**	86,037.00
නවනිපැයුම් ප්‍රදර්ශන	**-**	-
ප්‍රකාශනයන් සහ බෙදාහැරීම්	**68,196.80**	-
සංවර්ධන නවනිපැයුම් අවසන් මට්ටමේ නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධන	**-**	-
සංවර්ධන නවනිපැයුම් අවසන් මට්ටමේ නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධන- 2008	**-**	-
නවනිපැයුම් හරහා ජාතිය යළි ගොඩනැංවීම	**-**	3,358,316.73
පාසැල් නවනිපැයුම් කව	**-**	287,198.16
කාර්මික විද්‍යාලයන්හි නවනිපැයුම් කව පිහිටුවීම	**-**	51,910.00
සංවර්ධනය සඳහා මූල්‍යමය ආධාර	**-**	75,000.00
ශක්‍යතා වර්ධනය	**-**	5,000.00
විද්‍යාත්මක නවනිපැයුම් සොයාගැනීම්	**-**	474,032.54
ප්‍රදර්ශන සහ අලෙවි මධ්‍යස්ථාන ස්ථාපනය	**-**	-
වැඩිදුර සංවර්ධනය සඳහා මූල්‍යමය සහ තාක්ෂණික සහායය	**353,845.31**	-
ශ්‍රී:ල:න:කො: සඳහා වෙබ් අඩවියක් වැඩිදියුණු කිරීම සහ නවනිපැයුම් බැංකුවක් ස්ථාපනය	**80,500.00**	-
නවනිපැයුම් සංවිධානය කිරීම (පාසැල්. අධ්‍යාපන, කලාපීය මට්ටමින්)	**23,464.00**	-
නවනිපැයුම් ක්‍රියාවලිය පාසැල් මට්ටමින් යළි සක්‍රීය කරවීම	**504,933.70**	-
ජාතික මට්ටමින් ප්‍රදර්ශන/ නවනිපැයුම් වෙළඳ සැණකෙළි	**503,923.00**	-
දේශීය ආදායම්	**116,069.25**	-
	3,169,056.49	4,363,454.43
අංක 04 - වෙනත් ආදායම්		
ආපදා ණය පොළිය	**28,844.38**	38,295.27
විශේෂ අත්තිකාරම් පොළිය	**-**	-
ණය පොළිය - නවනිපැයුම්කරුවනගේ අරමුදල	**35,887.80**	11,250.00
වෙනත් ආදායම්	**93,943.00**	610,235.00
වෙනත් ආදායම් - නවනිපැයුම්කරුවනගේ අරමුදල	**-**	-
	158,675.18	659,780.27
අංක 07 - අත්තිකාරම්		
අත්තිකාරම්	**136,632.80**	2,835,094.30
	136,632.80	2,835,094.30
අංක 08 - මුදල් සහ බැංකු ශේෂ		
ගිණුම් අංක 033-1-001-0-1791066 (T/F)	**17,523.42**	246,029.11
ගිණුම් අංක 033-1-001-2-1791065 (P/F)	**3,391915.07**	3,184,502.07
සුළු මුදල් - මුද්දර	**-**	-
	3,409,438.49	3,430,531.18

<u>සටහන **05**</u>

<u>ස්ථාවර වත්කම් සහ ක්ෂයවීම් ගාස්තු</u>

ශ්‍රී.ලං.ග.ප්‍ර. 18

කාණ්ඩය	ක්ෂයවීමේ අනුපාතය	මිළදී ගැනීමේ කාලසීමාව 2011.01.01	2011 දී එකතු කිරීම (වියදම් ලෙස)	2011.12.31 දිනට මුළු වියදම	2011.01.01 දක්වා ක්ෂයවීමේ සමුච්චිත ගාස්තු	2011 සඳහා ක්ෂයවීමේ ගාස්තු	2011.12.31 දිනට සමුච්චිත ගාස්තු	2011.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් වටිනාකම
		රු:	රු:	රු:	රු:	රු:	රු:	රු:
1. <u>ලී බඩු උපකරණ</u>	15%							
අ. ලී බඩු උපකරණ		537,751.00		537,751.00	219,128.46	80,662.50	299,790.96	237,960.04
ආ. විධායක පුටු		157,222.50		157,222.50	94,333.52	23,583.38	117,916.90	39,305.60
ඇ. යතුරු ලියන මේස		4,700.00		4,700.00	4,700.00		4,700.00	-
ඈ. රාක්ක සහ පෙට්ටි		90,236.00		90,236.00	73,891.00	7,507.50	81,398.50	8,837.50
ඉ. එහා මෙහා කල හැකි කැබිනෙට්ටු		14,787.00		14,787.00	8,872.20	2,218.05	11,090.25	3,696.75
		804,696.50		**804,696.50**	**400,925.18**	**113,971.43**	**514,896.61**	**289,799.89**
2. <u>කාර්යාලීය උපකරණ</u>	20%							
අ. කාර්යාලීය උපකරණ		771,756.70		771,756.70	670,914.30	20,564.60	691,478.90	80,277.80
ආ. ඉලෙක්ට්‍රොනික යතුරු ලියන		117,887.50		117,887.50	117,887.50		117,887.50	-
ඇ. පරිගණක සහ උපාංග		5,871,130.18	172,210.00	6,043,340.18	4,545,063.68	834,276.50	5,379,340.18	664,000.00
ඈ. ඡායාපිටපත් යන්ත්‍රය		385,400.00		385,400.00	191,080.00		191,080.00	194,320.00
ඉ. දුරකථන		337,149.95	4,900.00	342,049.95	258,138.75	52,206.04	310,344.79	31,705.16
ඊ. ඩුප්ලිකේටරය		717,875.00		717,875.00	654,625.00	63,250.00	717,875.00	-
		8,201,199.33	**177,110.00**	**8,378,309.33**	**6,437,709.23**	**970,297.14**	**7,408,006.37**	**970,302.96**
3. අ.මූලාදර්ශ ආකෘතීන් සහ නාමපුවරු	10%	105,495.00		105,495.00	104,246.00	1,249.00	105,495.00	-
ආ. ප්‍රදර්ශක මධ්‍යස්ථාන		110,805.00		110,805.00	56,324.15	11,080.50	67,404.65	43,400.35
		216,300.00		**216,300.00**	**160,570.15**	**12,329.50**	**172,899.65**	**43,400.35**
4. පුස්තකාල පොත්	10%	**193,357.48**		**193,357.48**	**181,459.58**	**3,540.60**	**185,000.18**	**8,357.30**
5. වාහන	20%	**9,557,842.83**		**9,557,842.83**	**8,023,490.60**	**1,507,832.17**	**9,531,322.77**	**26,520.06**
6. ප්‍රදර්ශන කුටි	25%							
අ. ප්‍රදර්ශන කුටි		127,429.75		127,429.75	127,429.75	0.00	127,429.75	-
ආ. තිරරෙදි		37,690.00		37690.00	19,052.50	6,212.50	25,265.00	12,425.00
		165,119.75		**165,119.75**	**146,482.25**	**6,212.50**	**152,694.75**	**12,425.00**
7. ප්‍රක්ෂේපන යන්ත්‍ර සහ කැමරා	20%	**1,715,068.50**		**1,715,068.50**	**1,224,723.50**	**264,857.00**	**1,489,580.50**	**225,488.00**
8. රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	20%	**146,850.00**	**15,150.00**	**162,000.00**	**110,430.00**	**12,140.00**	**122,570.00**	**39,430.00**
9. කාර්යාලීය සවිකුරු	15%	**1,016,868.76**		**1,016,868.76**	**627,089.24**	**132,509.81**	**759,599.05**	**257,269.71**
		22,017,303.15	**192,260.00**	**22,209,563.15**	**17,312,879.73**	**3,023,690.15**	**20,336,569.88**	**1,872,993.27**

ගිණුම් සටහන්

	2011 රු. ශත.	2010 රු. ශත.
අංක 09 -සමුච්චිත අරමුදල		
ශේෂය ඉදිරියට ගෙන ගියා - රජයේ දායකත්වය - ප්‍රාග්ධන	**11,612,148.91**	17,615,239.71
සමුච්චිත ශේෂය ඉදිරියට ගෙන ගියා (හිඟ / අතිරික්ත)	**(7,675,762.38)**	(7,472,478.60)
රජයේ දායකත්වය - ප්‍රාග්ධන	**6,151,010.00**	4,500.000.00
ගැලපීම් - **JE/02**		(370,390.20)
පාරිතෝෂික	**-**	38,250.00
	10,087,396.53	14,310,620.91
අංක 10 - වෙනත් අරමුදල්		
නවනිපැයුම්කරුවන්ගේ අරමුදල	**2,522,375.59**	2,502,375.59
පෙළොන්නරු දිස්ත්‍රික් අරමුදල	**21,074.75**	21,074.75
	2,543,450.34	2,523,450.34
අංක 11 - පාරිතෝෂික සඳහා සැපයීම්		
2011.01.01 දිනට ශේෂය	**1,455,287.50**	1,298,355.00
අධි වෙන්කිරීම්	**-**	(38,250.00)
වසර සඳහා සැපයීම්	**169,261.38**	195,182.50
පාර්තෝෂික ගෙවීම	**(157,107.50)**	-
2011.12.31 දිනට ශේෂය	**1,467,441.38**	1,455,287.50
අංක 12 - උපචිත වියදම්		
වැටුප්	**17,376.00**	17,728.00
ජීවන වියදම්	**7,995.00**	7,350.00
විශේෂ දීමනාව	**2,606.40**	-
ඉන්ධන සහ ලිහිසි තෙල්	**15,960.00**	-
අතිකාල සහ නිවාඩු දින සඳහා වැටුප්	**14,233.80**	77,499.00
පුවත්පත් සහ වාර සඟරා	**1,780.00**	4,320.00
ගමන් - දේශීය	**-**	11,375.00
දුරකථන ගාස්තු	**36,782.28**	22,290.67
විදුලි ගාස්තු	**34,894.65**	32,534.86
ජල ගාස්තු	**8,492.28**	11,715.24
නැවත ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව	**36,087.20**	36,087.20
ණය හිමියෝ	**82,860.65**	82,860.65
විගණන ගාස්තු	**920,000.00**	670,000.00
මානෙල් කාන්ති	**503.27**	503.27
අධ්‍යාපන අමාත්‍යාංශය	**46,305.00**	46,305.00
	1,225,876.53	1,020.568.89
නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්		
උපචිත වියදම්		
නිර්මාණශීලි සමිති සංවිධානය	**-**	-
ජාත්‍යන්තර ප්‍රදර්ශන	**903,399.52**	1,697,792.80
ප්‍රකාශනය සහ බෙදාහැරීම්	**-**	1,171,218.40
ප්‍රදර්ශන සහ අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපනය	**-**	-
	903,399.52	2,869,011.20
මුළු උපචිත වියදම්	**2,129,276.05**	

<u>අංක 13</u>

<u>ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්</u>

ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් නොවිණි

<u>රාජ්‍ය ප්‍රධාන</u>

2011 වසර සඳහා රජයේ දායකත්වය පිළිබඳ සාරාංශය පහත දැක්වේ

<u>ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 හා අනුකූලව</u>	**රු. ශත.**
පුනරාවර්තන ප්‍රදාන	11,963,400.00
ප්‍රාග්ධන ප්‍රදාන	6,151,010.00

<u>අදාළ පාර්ශවයන්හි හෙළිදරව් කිරීම්</u>

2011 වර්ෂය තුළදී අදාළ පාර්ශවයන්හි හෙළිදරව් කිරීම් කිසිවක් නොතිබිණි.

මූලාශ්‍ර ව්‍යුහය

රජයේ දායකත්වය පිළිබඳ ගිණුම් ලේඛණය

වර්ෂය	රජයේ දායකත්වය ප්‍රාග්ධන
1991	163,050.00
1992	1,700,000.00
1993	-
1994	250,000.00
1995	196,000.00
1996	113,500.00
1997	757,000.00
1998	1,700,000.00
1999	290,000.00
2000	4,500,000.00
2001	2,870,000.00
2002	700,000.00
2003	2,500,000.00
2004	621,000.00
2005	5,997,000.00
2006	33,991,000.00
2007	37,100,000.00
2008	24,106,000.00
2009	15,765,000.00
2010	4,500,000.00
2011	6,151,010.00

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

01. 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ස්ථාපනය කරනු ලැබිණි.

02. අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් පිළිබඳ පනත හා අනුකූලත්වය දකවා ඇත.

03. සැකසීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව සකස් කොට ඇති අතර ඓතිහාසික පිරිවැය පදනමක් මත අඛණ්ඩව භාවිතයට ගැනේ.

04. අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සඳහා රජයේ දායකත්වය රජයේ වාර්ෂික ඇස්තමේනතුවෙහි අයිතම 2ක් යටතේ පැහැදිලිව දක්වා ඇත.

ඒවා නම් : (i) පුනරාවර්තන වියදම් සඳහා මුදල්
(ii) ප්‍රාග්ධන වියදම් සඳහා මුදල්

පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයන් ආදායම් සහ වියදම් ගිණුමට ගෙන ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයන් ඍජුව ප්‍රාග්ධන ගිණුමට , එනම් සමුච්චිත අරමුදල වෙත ගෙන ඇත.

කොමිසමෙහි පුනරාවර්තන වියදම ආදායම් සහ වියදම් ගිණුම යටතේ

(i) පාලන හා ආයතන වියදම්
(ii) පර්යේෂණ සහ සංවර්ධන වියදම වශයෙන් දක්වා ඇති අතර පර්යේෂණ සහ සංවර්ධන වියදම ආදායම් හා වියදම් ගිණුමෙහි ව්‍යාපෘති වියදම් ලෙස ලියා හරිනු ඇත.

1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතෙහි අරමුණු සපුරාගැනීම සඳහා භාරගනු ලැබූ ක්‍රියාකාරකම් වෙනුවෙන් කොමිසම විසින් දරනු ලැබූ වියදම් පර්යේෂණ සහ සංවර්ධනය වන වියදම් සඳහා ඇතුළත් වේ.

05. ක්ෂය වීම.

ස්ථාවර වත්කම් සඳහා ඍජු රේඛා ක්‍රමය යටතේ ක්ෂයවීම ගණනය කොට ඇත. වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිතකාලයට එරෙහිව ලියාහැරීම සඳහා පහත ක්ෂයවීමේ ප්‍රතිශතයන් යොදාගනු ලැබ ඇත.

	ප්‍රතිශතය
අ) ලී බඩු උපකරණ	15%
ආ) කාර්යාල උපකරණ	20%
ඇ) මූලාදර්ශ ආකෘති හා නාමපුවරු	10%
ඈ) පුස්තකාල පොත්	10%
ඉ) වාහන	20%
ඊ) ප්‍රදර්ශන කුටි	25%

2006 වසරේ සිට ඉහත සඳහන් ක්ෂයවීම් ප්‍රතිශතයන් හා අනුකූලව ක්ෂයවීම් ගාස්තු ගණනය කෙරිණි.

06. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී.ලං.ගි.ප්‍ර. 09 හා අනුකූලව වක්‍රාකාර ක්‍රමය අනුව සකස් කොට ඇත.

07. පාරිතෝෂික සඳහා වෙන්කිරීම.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ඊඩීඑල්/ඊ/එස්එල්අයිසී/එෆ්/ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2012 අගෝස්තු [illegible] දින

සභාපති,
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම.

<u>ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන්වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර කොමිසමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිසමේ සභාපති වෙත 2012 මැයි 24 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම.</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / தொலைநகல் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்னஞ்சல் / E-mail: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට නව නිපැයුම් කොමිසමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ). ශ්‍රී.ල.ගි.ප්‍ර.16 එක් වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහාත් පාර්තෝෂික වෙන්කිරීම කළයුතු වුවත්, වර්ෂ 5 ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙනුවෙන් පමණක් පාර්තෝෂික වෙන් කර තිබුණි.

(ආ). ශ්‍රී.ල.ගි.ප්‍ර.18 ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදී පොත් අගය ශූන්‍ය වූ, එහෙත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඇ). ශ්‍රී.ල.ගි.ප්‍ර.24 වත්කම් මිළදී ගැනීම සඳහා යොදා ගන්නා ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). සොමිසම නමින් ලියාපදිංචි කර තිබූ රුපියල් මිලියන හයකට(6) තක්සේරු කරන ලද මෝටර් රථයේ වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. (2009 වර්ෂයේ සිට විගණන වාර්තා වලින් මේ පිළිබඳව පෙන්වාදී තිබුණු)

(ආ). බත්තරමුල්ල ප්‍රදේශයෙන් කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවා ඇති ආපසු අයකර ගතහැකි තැන්පත් මුදල වූ රු.125,000 ක් සමාලෝචිත වර්ෂයේදීද ගිණුම් ගත කර නොතිබුණි.

2.2.3 **අයවිය යුතු ගිණුම්**

වර්ෂ 5කට වැඩි කාලයක සිට පැවත එන පහත සඳහන් අයවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

	රුපියල්
විවිධ ණයගිම්යෝ	82,861
අධ්‍යාපන අමාත්‍යාංශය	46,305
මාතෙල්, මල්කාන්ති	503

	129,669
	======

2.2.4. **විගණනය සඳහා සාක්ෂි නොතිබීම.**

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ගිණුම් විෂයය	වටිනාකම රු:	ඉදිරිපත් නොවූත සාක්ෂි
බැංකුවේ සහ අතැති මුදල්	3,409,438	ශේෂ සහාට සිරම්
ණයගිම්යෝ	82,861	උපලේඛන
අත්තිකාරම්	136,633	උපලේඛන
අත්තිකාරම් පියවීම	2,698,472	ඒ' තල් සටහන්

2.2.5. **නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති,රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ).	2004 අගෝස්තු 31 දිනැති අංක 353 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	රාජ්‍ය ආයතනවල වාහන අපහරණයෙන් ලැබෙන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුවත් වාහන අපහරණයෙන් ලැබුණු රු.1,036,000 ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට සමාලෝචිත වර්ෂයේද ක්‍රියා කර නොතිබුණි.

(ආ).	2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 9.3.1 ඡේදය	රු.100,000 ට වඩා වැඩි රථවාහන අලුත්වැඩියා වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී K1-0614 රථය වෙනුවෙන් දරණ ලද රු.187,000 ක් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.
(ඇ).	2002 පෙබරවාරි 22 දිනැති අංක.01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	කොමිසමේ සතු වාහන 05 ක රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6. මතභේදයට තුඩුදෙන ගණුදෙනු

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට අරමුදල් 02 ක ශේෂය රු.2,543,450 ක් වූ අතර, මෙම අරමුදල් පිහිටුවීමේ අරමුණු කුමක්ද යන්න විගණනයේදී හෙළිදරව් නොවුණි. වර්ෂ ගණනාවක සිට අරමුදල් ගිණුමේ ශේෂ චලනය නොවී පැවතුන අතර අරමුදලට අදාළ වත්කම් හඳුනා ගැනීමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

	රු.
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	2,522,375
පොළොන්නරුව දිස්ත්‍රික් අරමුදල	21,074
	2,543,450

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.7,675,762 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපී ඌනතාවය රු.7,472,478 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.203,284 ක ඌනතාවය වැඩිවීම සඳහා රු.2,224,706 කින් ආදායම් අඩුවීම හා රු.2,021,422 කින් වියදම් අඩුවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). 2011 වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාර සැලැස්මට අනුව ක්‍රියාකර නොමැති බැව් නිරීක්ෂණය විය. වර්ෂය තුළ අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා රු.මිලියන 40 ක් වෙන්කර තිබුනද, සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණේ රු.4,804,757 ක් පමණි. වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට ඇතුළත් කර නොතිබූ 2009 වර්ෂයේදී සිදුකළ කාර්යයක් වෙනුවෙන් රු.1,977,808 ක් වැය කර තිබූ බවද විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

	රු.
ජාත්‍යන්තරය ජයගත් නව නිපැයුම්කරුවන්නට සුභ පැතීමට පුවත්පත් දැන්වීම් සඳහා	1,183,415
නව නිපැයුම් ප්‍රදර්ශනයකට සහභාගිවීම	794,393
	1,977,808

(ආ). 2011 ක්‍රියාකාර සැලැස්මට අනුව සිදු කිරීමට අපේක්ෂිතව තිබූ ප්‍රතිපාදන වෙන්කළ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ඉටු කර නොතිබුණි.

	අපේක්ෂිත කාර්යය	වෙන්කර ඇති ප්‍රතිපාදනය රු.මිලියන	ලඟා කරගෙන ඇති ප්‍රතිඵල
(i).	නර්ඩ් ආයතනය, කාර්මික විද්‍යාල හරහා තෝරා ගත් නව නිපැයුම් සඳහා කාර්මික හා මූල්‍ය ආධාර සැපයීම	05	කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි
(ii).	ජාතික මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීම	10	ප්‍රදර්ශන පවත්වා නොතිබුණි

(iii).	ජාත්‍යන්තර ප්‍රදර්ශන හා තරග සඳහා සහභාගිවීම	02	සහභාගිවී නැත
(iv).	පාසැල් මට්ටමින් හා කලාප මට්ටමින් නව නිපැයුම් ප්‍රදර්ශනය කිරීම	4.5	නව නිපැයුම් ප්‍රදර්ශන පවත්වා නොතිබුණු අතර රු.463,906 ක් වැය කර සම්මන්ත්‍රණ පවත්වා ඇත.
(v).	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	2.2	රු.183,010 ක ලැප්ටොප් 01 ක් පමණක් මිලදී ගෙන තිබුණි.

(ඈ). <u>නව නිපැයුම් ප්‍රවර්ධනය සඳහා දී ඇති ණය</u>

නව නිපැයුම්කරුවන් වශයෙන් හඳුනාගෙන ඇති පුද්ගලයින් 12 දෙනෙකුට නව නිපැයුම් ප්‍රවර්ධනය සඳහා 2008/2009 වර්ෂවල ලබාදී තිබූ රු.10,200,000 ක ණය මුදල සම්බන්ධව නිරීක්ෂණ පහත දැක්වේ.

(i). නව නිපැයුම්කරුවන් සඳහා දී ඇති ණය සඳහා වාරික හා පොලී නියි අයුරින් අය නොවන අතර, මෙතෙක් අයවී තිබුණේ රු.418,196.00 ක් පමණි. 2011දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.9,781,804.00 ක් වූ අතර එම මුදල අයකර ගැනීමට විධිමත් ක්‍රියා මාර්ගයක් කොමිසම විසින් ගෙන නොතිබුණි.

(ii). ණය ලබාගත් නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු පමණක් ණය වාරික හා පොලී ගෙවන අතර, රු.8,200,000.00 ක් ලබාගත් නව නිපැයුම්කරුවන් දස දෙනෙකු ණය ගෙවීම අතහැර දමා තිබූ අතර, මෙම මුදල් අය කර ගැනීම දැක සහිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii). ණය හා ආධාර දීමෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටු වුයේද හා එම මුදල් අදාල කාර්යයටම යොදවා තිබේද යන්න පිළිබඳව කිසිදු අධීක්ෂණයක් හෝ පසු විපරමක් කොමිසම විසින් සිදු කර නොතිබුණි.

4.2. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ දිරිගැන්වීමේ පනතේ 11(1) වගන්තිය අනුව කොමිසම විසින් ඉටු කළයුතු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(i). පේටන්ට් බලපත්‍ර ලබා දීමට සුදුසු නව නිපැයුම් තෝරා පේටන්ට් බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(ii). ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපල අයිතින් උල්ලංඝනය වන විටදී ඔවුන්ගේ බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහාය ලබාදීම.

(iii). පේටන්ට් බලපත්‍රය ඇපයට ගෙන රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් ණය ලබා දීමට හැකිවන පරිදි වාණිජමය වටිනාකමකින් යුත් නව නිපැයුම් නිර්දේශ කිරීම.

(iv). දේශීය හා විදේශීය වෙළෙඳපොළ පහසුකම් සොයා ගැනීමට උපකාර කිරීම.

(v). නව නිපැයුම් සඳහා පර්යේෂණ සිදු කිරීමට හැකිවන පරිදි සැමට විවෘත පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම.

(vi). නව නිපැයුම් පුවත් සඟරාවට මුද්‍රණය කිරීම හා රූපවාහිනී, ගුවන්විදුලි වැඩසටහන් හා අනෙකුත් මාධ්‍ය වැඩසටහන් මගින් නව නිපැයුම්කරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

(vii). නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පල කිරීම සහ පතල කර හැරීම.

(viii). නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ix). නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරග වලට සහභාගී වීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උපකාරවීම හා එවැනි තරග වලට ඔවුන් නිර්දේශ කිරීම.

(x). පාසැල්වල, විද්‍යාලවල සහ විශ්ව විද්‍යාලවල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

4.3. නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). කොමිසම සතු ඩබල් කැබ් රථයක් හා පෙජරෝ ජීප් රථයක් වර්ෂ ගණනාවක සිට ධාවනයේ නොයොදවා නිෂ්ක්‍රියව තිබුණි.

(ආ). කොමිසම සතුව වාහන 5 ක් පැවතියද එය ධාවනය කරවීම සඳහා කොමිසම් අළ වූයේ රියදුරන් දෙදෙනෙකු පමණි.

(ඇ). නව නිපැයුම්කරුවන් සඳහා ණය දීමට හා ණය අයවීම් වෙනුවෙන් විවෘත කර ඇති බැංකු ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට රු.3,391,915 ක් වූ අතර, 2010 වර්ෂයේ සිට ණයදීම් හා ණය අයකිරීම් සිදු නොවන බැවින් මෙම ගිණුම අක්‍රියව තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස ලැබී තිබුණු රු.2,394,090 න් රු.1,965,611 ක් වැය කර තිබුණේ පෙර වර්ෂ වලට අදාළ ප්‍රචාරණ වියදම් ගෙවීම සඳහා ය.

4.4. අනාර්ථික ගණුදෙනු

2011 මැයි 14 දිනැති සීඑ/1/17/1 දරණ ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට අනුව, අමාත්‍යාංශ සහ ඒ යටතේ පවත්නා සියළුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථා වලට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යායුතු වුවද, කොමිසම විසින් රු.433,325 ක් වූ මාසික කුලියක් ගෙවා ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
SRI LANKA INVENTORS COMMISSION
இலங்கைப் புத்தாக்குநர் ஆணைக்குழு

[Ministry of Technology & Research]

මගේ අංකය / எனது இல. / My No. 2-8/AR-2011

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2012.07.05

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව,

<u>ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

(අ) ශ්‍රී. ල. ගි. ප්‍ර. 16 ගිණුම් වල සටහන් කර ඇත.

(ආ) ශ්‍රී. ල. ගි. ප්‍ර. 18 වාහන ප්‍රත්‍යාගණනය කර අපහරණය කර ඇත.

(ඇ) ශ්‍රී. ල. ගි. ප්‍ර. 24 මෙය ප්‍රාග්ධන ප්‍රදානයක් නොවන අතර ගෙවිය යුතු වටිනාකම ගිණුම් ගත කර ඇත.

2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) ගිණුම්ගත කර ඇත.

(ආ) තැන්පත් මුදල ගිණුම් ගත කර හිලව් කර ගැනීමට කටයුතු කර ඇත.

2.2.3. <u>ගෙවිය යුතු ගිණුම්</u>

පාලක මණ්ඩලයට යොමුකර ලියා හැරීමට සටහන් කර ගෙන ඇත.

46/56, ලැන්ලිබ් ගොඩනැගිල්ල, නවම් මාවත, කොළඹ 02
46/56, Lanlib Building, Nawam Mawatha, Colombo 02

Telephone: 011-2424964
Fax: 011-2437354

Web: www.slic.gov.lk
Email: info@slic.gov.lk

Director
Telephone: 011-2394756

2.2.4. විගණනය සඳහා සාක්ෂි නොතිබීම

බැංකු සහ අනැති මුදල් ශේෂ සතාර කිරීම් සඳහා බැංකු ප්‍රකාශන ලැබී ඇත.

ණයගිම්යෝ හා අත්තිකාරම් ලෙස දීර්ඝ කාලයක සිට ගිණුම් වල දක්වා ඇති මෙම ණය ශේෂ පිළිබඳ විස්තර සොයාගත නොහැකි නිසා මේ පිළිබඳව පාලක මණ්ඩලයට යොමු කර ලියා හැරීමට සටහන් කර ගෙන ඇත. අත්තිකාරම් පියවීම වෙනුවෙන් ජර්නල් සටහනක් ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

2.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) මේ පිළිබඳ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් විමසා ඉදිරි පියවර ගැනීමට සකස් කර ගෙන ඇත.

(ආ) 2011.01.01 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 20 අනුව රු. 250,000/= අධිකාරී සීමාව තුල ඉහත අලුත් වැඩියාව සිදුකර ඇත.

(ඇ) රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.

2.2.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

දැනට අක්‍රියව පවතින පොළොන්නරුව දිස්ත්‍රික් අරමුදල නව නිපැයුම්කරුවන්ගේ අරමුදලට භාර කිරීමට කටයුතු කර ඇත.

නව නිපැයුම්කරුවන්ගේ අරමුදල නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීමේ අරමුණින් පිහිටුවා ඇති අතර මූල්‍යාධාර ලබා දිය යුතු නව නිපැයුම්කරුවන් හදුනා ගනිමින් පවතී.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩල අනුමැතිය අත්‍යාවශ්‍ය වේ. නව පාලක මණ්ඩලය පත් කිරීම 2011.08.01 දින සිට සිදු කර ඇති බැවින් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම එදින සිට ඉදිරියට සිදු විය. ඒ අනුව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වූයේ 2011 වර්ෂයේ අවසන් මාස 04 තුලදීය.

පෙර වර්ෂයක් වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් දරණ ලද වියදම් වෙනුවෙන් අදාළ ආයතනය විසින් බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් පිළිබඳ සනාථ කර ගෙන ගෙවිය යුතු වගකීම් වන රු. 1,977,808/= නිරවුල් කර ඇත.

(ආ) i, ii, iii, iv

කොමිසමේ පාලක මණ්ඩලය පත්කිරීම 2011.08.01 දින සිදු කල බැවින් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිසි පරිදි සිදු කළ බැවින් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

නව නිපැයුම් ප්‍රවර්ධනය සඳහා දී ඇති ණය

(ඇ) i, ii

ණය මුදල් අයකර ගැනීමේ අරමුණෙන් ණය ලබා ගත් නව නිපැයුම්කරුවන්ට සිහිපත්කිරීම් ලිඛිතව දන්වා ඇති අතර යහපත් ප්‍රතිචාර නොමැති බැවින් පාලක මණ්ඩලයට යොමුකර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිතය.

iii

කමිටුවක් මගින් ණයදුන් ණයකරුවන්ගේ භෞතික තොරතුරු විමර්ශනය කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු ඇති අතර වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) – (ඡ) 2011 අගෝස්තු මාසයේදී නව පාලක මණ්ඩලය පත් කිරීමෙන් අනතුරුව කොමිසම විසින් මූලික අවධානය යොමු කරනු ලැබුවේ 2008, 2009 හා 2010 වර්ෂ සඳහා පවත්වා නොතිබූ ජනාධිපති සම්මාන උළෙල පැවැත්වීම සඳහා වන අතර එම නිසා අනෙකුත් අරමුණු සිහින කාල පරිච්ඡේදයක් තුළදී සපුරා ගත නොහැකි විය. කෙසේ වුවද මෙම වර්ෂයේ සිට කටයුතු ද සිදුකෙරෙමින් පවතී.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) අදාල තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසු අපහරණය කිරීමට කටයුතු කර ඇත.

(ආ) වාහන 05න් 02ක් පාවිච්චි කළ නොහැකි මට්ටමේ තිබූ බැවින් අපහරණය කිරීමට තීරණය කර තිබුණි. නව කාර්ය මණ්ඩලය යටතේ නව රියදුරු තනතුරක් අනුමත වී ඇති අතර බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) නව නිපැයුම්කරුවන්ට ණය ලබා දීමෙන් පසු ඒවා අයකර ගැනීම ඉතා අපහසු බවට පූර්වාදර්ශ ඇති බැවින් ණය ලබා දීම වෙනුවට නව නිපැයුම් දිරිගැන්වීම සඳහා මූලාධාර ලබාදීමේ විධිමත් ක්‍රමයක් සකස් කරමින් පවතී.

(ඈ) පෙර වර්ෂ වල සංවර්ධන කටයුතු වෙනුවෙන් වගකීම් වලට බැඳුණු වියදම් වෙනුවෙන් අදාල වියදම් සනාථ කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් කර ඇත .

4.4 අනාර්ථික ගණුදෙනු

බත්තරමුල්ලේ ඉදිවන නව සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ ඉඩකඩ ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරි වර්ෂයේදී ආයතනය එම නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට නියමිතය.

4.5 මානව සම්පත් කළමනාකරණය

පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරෙමින් පවතී.

5. <u>ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය</u>

5.1 <u>සංයුක්ත සැලැස්ම</u>

2010 මැයි සිට කොමිසමේ පාලක මණ්ඩලය පත් කර නොතිබූ බැවින් සංයුක්ත සැලැස්ම සකස් කර නැත. 2011.08.01 දින නව කොමිසම පත් කිරීමෙන් අනතුරුව ඉදිරි වර්ෂ 03 සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර ඇත .

5.2 <u>අයවැය පාලනය</u>

කොමිසමේ පාලක මණ්ඩලය පත් කිරීම සිදු වූයේ 2011.08.01 දින වන අතර ඉන් පසු ඉදිරියට මාස 04 කාලයක් සඳහා පමණක් කොමිසමේ සංවර්ධන වැඩසටහන් සිදු කෙරුණි. එබැවින් අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර විචලනය ඇති විය.

6. <u>පද්ධති හා පාලන</u>

පද්ධති හා පාලන ක්ෂේත්‍ර සඳහා විධිමත් ක්‍රියා පරිපාටි සකස් කෙරෙමින් පවතී.

ඩී.අනුරාධා.එල්.ඉලේපෙරුම
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම